
# බුදුන් උපන් දේශයේ අයම බුදුන්ට අපහාස කරති

# බුදුන් වහන්සේට නිගාකරන ලන්ඩනයේ නේපාල අවන්හල

## Greedy Buddha හෙවත් කෑදර බුදුන්

by Pandula Ranatunga පණ්ඩුල රණතුංග

## Is this sheer audacity or just plain ignorance, to call your restaurant "Greedy Buddha" What's next ? - I asked the owner




Have they run out of names for restaurants? I am sure like thousands of other Buddhists you would also be horrified to see the name of one restaurant on Wandsworth Bridge Road in Fulham- The Greedy Buddha. The imbecile who came up with this name probably thought that this is a cool and hip name to have but anyone who has an ounce of knowledge on this great religion and its master would know how wrong and appalling this is. The truth of the matter is that the basic Buddha's teaching is based on giving up all worldly pleasures and materials, and finally reaching the ultimate bliss of Nirvana. The Buddha is someone who conquered the world giving up all desires including greed and lust. Imagine how inconsiderate and stupid this is to mock that. A religion that began closed to 2570 years ago in India and is still growing in popularity by the day in this materialistic world, is phenomenal, but for anyone to link that in to something as vile and cheap as this restaurant's name is nauseating and heart breaking. And adding insult to injury, the restaurant has Buddha's statue like a door wedge close to the bar where they sell alcohol, which you can see plastered on their website. What is tragic here is that it serves Nepalese food, a country associated with Buddha's life.

A few years back Sainsbury's and Homebase had candles made into Buddha's image with a wick attached to the top of the head. And these candles were not only in Sainsbury's they were also available in shops which mostly sell interior decorating goods. But the reality is that they were made in China and Thailand. I saw carpets and table mats with Buddha's image sold in a shop in Hampstead with other decorative materials. Once the Ceylon Tea packets had Polonaruwa Gal Vihara Buddha images and were sold in Sainsbury stores. Thanks to the, then Sri Lankan High Commissioner Mr Faize Musthapa, that was put to an end. The famous fashion lingerie wear line Victoria's Secret had the Buddha image printed on their skimpy bikini line and after huge uproar managed to get it discontinued. And most of their lingerie wear are made in Sri Lanka. Last year I came across in Sainsbury's store selling Sri Lankan meat curry in packs with Buddhas image on it, and I personally managed to get the design changed on their package after bit of persuasion. They even sent me their new package design which replaced the Buddha image with one of a Sri Lankan devil mask: At the end I was also sent some free samples asking my opinion about their improved taste. It was a small victory on my part and I still hold on to the proofs of that communication I had with them for posterity. One of the most recent one to hit the market was Buddha image on tissues (serviettes) which Lidel sold and that was put to an end with the help of the Sri Lanka High Commision . So far the most shocking I have come across was, the Buddha image on the toilet seat cover. And at least some of us can feel relief at the recent news that the famous "Buddha Bars" in cities like Paris and in London have gone into administration.

It was also in the last year I came across a website selling Buddha's image on a shoe collection, and that I offer thanks to the many who bombarded the website with emails, with the result that we managed to get that off the website and by conveying our annoyance to the designer persuaded him to discontinue the design. I remember once I was in Harrods Department store where their carpet section had a statue of Buddha and trumped up on the shoulder was a rolled carpet, which I managed to get it removed after speaking to their department manager. There were many incidents like this I personally have come across. It is a fact that out of all religious icons Buddha's image has been the most used image for aesthetic purposes especially in the interior decoration trade. Buddha's image fills the local garden centres, supermarkets, barber shops as well as seedier environments. Very soon it will be displayed in butcher shops.

We as Buddhists today all over the world are fighting a losing battle to save the Buddha's image from being exploited and used in offencive and demeaning manners without any regard whatsoever to the millions of people who worship Buddha and the followers of his religion. This irresponsible attitude is mostly due to ignorance. And for so many of us it's an automatic reaction to defend the Budd ha's image and we need to encourage others to do so as well, as all Buddhists have a duty to prevent these happening and to rally around when needed.

I have so far written to the proprietor of this restaurant explaining my shock and displeasure at his insensitivity and sheer audacity in choosing a name for his restaurant that insults all Buddhists. I have explained in my letter to him how sacred the Lord Buddha and his teachings are and how we revere them all throughout our lives. His is an image that we hold in a very high place in our hearts and minds. So for us to see his life and teachings being mocked for the sake of financial gains is quite disturbing. I am sure that he wouldn't use the name Allah or Jesus Christ in this manner as we all know the repercussions would be quite drastic. I think this is mainly because Buddhists are regarded as passive, peace loving and non-confrontational people, and thus always being taken for granted.

**ඒ**ක්වරම මගේ සිතට නැගුණේ මෙයයි. එනම් මුන්ට රෙස්ටුරන්ට් එකකට දාන්නට සුදුසු වෙන නමක් නැද්ද කියාය. ලන්ඩනයේ ෆුල්හැම් හි වොන්ඩ්ස්වර්ත් පාලම පාරේ (Wandsworth Bridge Road in Fulham, London) ඇති අවන්හලේ නම ග්‍රීඩ් බුද්ධ හෙවත් කෑදර බුදුන් යන්නයි. මේ නම තැබූ කවරෙක් හෝ මෝඩයා, අමනයා, මැටිමෝලා බුදු දහමේ සත්‍ය හරය කුමක්දැයි අබැටක් වත් දැන සිටින්නේද? බුදුන් යනු කෑදරකම, තණ්හාව, ආශාව දුරුකරන්නට උපදෙස් දුන්, එමගින් පමණක් නිර්වාණයට ළඟාවන්නට හැකි බව දෙසූ ශාස්තෘවරයාණෝය. එතුමන් කිසි විටක කෑදරකමක් අනුමත කළේද? එහෙත් මෙය මෝඩකමට වඩා තනිකරම බුදු දහමට නිගාකරන්නට කළ නීච ක්‍රියාවක් බව පැහැදිලිය. මේ පහත් ක්‍රියාව තවත් ඉදිරියට යමින් ඒ අවන්හලේ ඇතුළේ දොර වැහෙනවාට අඩයකට තබා ඇත්තේද බුද්ධ ප්‍රතිමාවකි. ඒ ප්‍රතිමාව ළඟම තිබෙන්නේ මත්පැන් අළෙවි කරන අවන්හලේ බාර් එකය. මෙහිදී සැලකිල්ලට ගතයුතු ප්‍රධානම කරුණ නම් මේ අවන්හල අළෙවිකරන්නේ නේපාලයේ ආහාරය. නේපාලය යනු බුදුන් වහන්සේ උපන් දේශයයි. ලුම්බිණී ජනපදය සල් උයන ඇත්තේ එහිය. එවැනි රටක මිනිසුන් මෙවැනි පහත් වැඩක් කරාවි යයි සිතන්නට වත් හැකිද?

මම මේ පිළබඳව එම අවන්හලේ අයිතිකරුට කරුණු පැහැදිලිකර මගේ තදබල විරුද්ධතාවද දක්වා උතුම් ශාස්තෘවරයෙකුට නිගා නොකරන ලෙසට ඉල්ලමින් වහා නම වෙනස් කරන ලෙසද කියා ලිපියක් යැවීමි. තවම එයට පිළිතුරක් නැත.

මේ කියවන ඔබගෙන්ද ඉල්ලා සිටින්නේ මෙවැනි ක්‍රියාවන්ට විරුද්ධව නැගී සිටින ලෙස ය. මේවා නුදුටුවාසේ හිඳීම මෛත්‍රිය නොවනබව සලකන්න. අද බෞද්ධයන් හඳුන්වන්නේ නෝංජල් පිරිසක් ලෙසිනි. බෞද්ධකම යනු නෝංජල්කම නොවේ.






**ල**න්ඩන් නගරයේ තිබෙන වීදි අතරින් **ඔක්ස්ෆර්ඩ් වීදිය** ඉතා ප්‍රසිද්ධයි. ඒ වගේම හැම විටම හරි සෙනග. ඒ එහි තියන සාප්පු සංකීර්ණය නිසා. ඒ මහවීදියෙ තියන වටරවුමට කියන්නෙ **ඔක්ස්ෆර්ඩ් වටරවුම** හෙවත් **ඔක්ස්ෆර්ඩ් සර්කස්** කියලා. එතනම තියන උමං දුම්රිය පළ හඳුන්වන්නෙත් **Oxford Circus** කියන නමෙන්. **සර්කස්** කියන ඉංග්‍රීසි වචනයට දෙන තව අර්ථයක් තමයි **සංදර්ශණය** කියන එක. ඒ සර්කස් බලන්න කවුරුත් කැමතියි. පිණුම්, කරනම්, සෙල්ලම්, කම්බිය දිගේ යෑම්, ඔය වගේ දේ අනන්තයි. ඔය අර්ථයෙන් ලංකාවෙ පුවත්පතක ශ්‍රීලංකා ජනාධිපතිවරයා ළඟදි කළ ඔක්ස්ෆර්ඩ් ගමන හඳුන්වලා තිබුණා. මටත් හිතුණා ඒ යෙදුම ඒ ගමනට අපූරුවට ගැලපෙනවා කියලා. ඒ වැඩේ තනිකරම සර්කස් එකක් වුණා තමයි අන්තිමට.

වැඩේ වුනයින් පස්සෙ දැන් පශ්චාත් මරණ පරීක්ෂණ (Post-Mortem) සීයක් විතර. මෙහෙමයි වුණේ.... නෑ මෙන්න මෙහෙමයි වුණේ... ඔය මොකක්වත් නෙවෙයි මෙන්න මේකයි වුණේ.... ඔය ආදී වශයෙන්. විධි සීයක් විතර එක එක්කෙනා පෙන්නනවා. ඒ විධි කොහොම වුනත් එංගලන්තෙ ඉන්න කෙනෙක් හැටියට වෙලේගෙදර රාළ මේ සර්කස් එක දැක්කෙ මෙන්න මේ විදියටයි.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලෙ එක එක රටවල ළමයි ඉගෙනගන්නවා. ඒ හැමෝම තමන්ගෙ සංගමයක් පිහිටුවා ගන්නවා. තුර්කි සංගමය, ඉන්දියන් සංගමය, පකිස්තාන් සංගමය, නේපාල සංගමය, පිලිපීන සංගමය, ඔය ආදී වශයෙන්. ඉතින් ලංකාවෙන් ආපු ළමයිත් දාගත්තා ශ්‍රීලංකා සංගමයක්. මේ සංගම් වලින් වාර්ෂිකව කවුරු හරි තමන්ගෙ රටේ විද්වතෙක් කලාකාරයෙක් කෙරුමෙක් ගෙන්නලා දේශනයක් දෙන්න ලෑස්ති කරනවා. ඒකට අවශ්‍ය ආරාධනා ලියුම අර ශිෂ්‍ය සංගමයෙන් හදල දුන්නම ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලෙ ඔපිස් එකෙන් ඔක්ස්ෆර්ඩ් ලියුම් කොලේක ගහලා යවනවා. ඊට අවශ්‍ය ශාලාව අර ශිෂ්‍ය සංගමයට වෙන්කරලා දෙනවා. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලෙ ලංකාවෙ ශිෂ්‍යයෝ දෙමළ, සිංහළ ඉන්නෙ ඔක්කොම 35 ක් විතර. එයින් සිංහළ ශිෂ්‍යයෝ 16 යි ඉන්නෙ. ඒ අයත් අට අට දෙකට බෙදිලා. මේ එක ගෲප් එකක සිංහළ ශිෂ්‍යයෝ 8 ක් එකතුවෙලා තමයි ලංකා ජනාධිපතිට දේශනයකට ආරාධනා කළේ.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලෙන් ලංකා ජනාධිපතිට ආරාධනා කළා කිව්වම ලංකාවෙ කවුරුත් හිතුවෙ අර ඉස්සර බණ්ඩාරනායක මහත්තෙයා, ඇතුලත්මුදලි මහත්තෙයා හොබවපු සම්භාවනීය ඔක්ස්ෆර්ඩ් යූනියන් එක කියලා. හොඳට මතක තියාගන්න මේ ඒක නෙවෙයි. මේ ලංකා ශිෂ්‍යයෝ කීපදෙනාගෙ සමිතිය. මෙතන වල්ගෙ පැගිලා බව පේනවා. ඒකයි මේ සේරමටම මුල.

ලංකා ජනාධිපති එන එක රහසක් නෙවෙයි නේ. කොහොමත් නිව්ස් එක කලින්ම යනව. දෙමළ ඩයස්පෝරාව පරණ කොටි කොඩි ටිකයි, ඉස්සර ඇඳපු පෝස්ටර් සටන්පාඨ ටිකයි අරන් එළියට බහින්න සංවිධානය වුණා. අර පාර්ලිමේන්තුව ළඟ හැම්බර්ගර් කකා මාරාන්තික උපවාසෙ කරපු කස්ටියම තමයි.

මේ ආරාධනාව බ්‍රිතාන්‍ය රජයෙන් කරපු නිල ආරාධනයක් නොවෙන නිසා පූර්ණ ආරක්ෂාව කිසිදු විදේශ නායකයෙකුට නොදෙන බවත්, ආරක්ෂාව යම් ප්‍රමාණයකට දෙන බවත් මෙහේ පුවත්පත්වලත් පළවුණා. මේ ගමන තඹ සතේක ලංකාවට ප්‍රයෝජනවත් ගමනක් නෙවෙයි. මේ කොල්ලො දෙතුන් දෙනෙකුගෙ කීමට එන ගමනක්. ඒ එක්කම එංගලන්තය කියන්නෙ දැනට ලංකාවට එරෙහිව යුධ අපරාධ චෝදනා ගෙනැල්ලා මාසෙකට සැරයක් රූපවාහිනියෙ පෙන්වන රටක්. අපේ යුද ජයග්‍රහණය හැල්ලුවෙන් හිතන රටක්. කොටින්ගෙ මහාවීර දිනේට සුබපතලා ලියුම් යවන මන්ත්‍රීවරු ඇමතිවරු ඉන්න රටක්. කොටි ත්‍රස්තයින් විශාල වශයෙන් සංවිධානය වෙලා ඉන්න රටක්.

ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලයෙන් ලංකාවට මෙහේ තත්වය දන්වලා යවලා ඉල්ලා සිටියා එන්න එපා කියලා. ලන්ඩනයේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ ශාඛාවෙන් වැදලා ජනපතිට කිව්වා “ සර් එන්න එපා ආවොත් ප්‍රශ්න ඇතිවෙනවා ” කියලා. ජනපති වටා ඉන්න පුරෝහිතයො එතුමාට පෙන්නුවෙ වෙනම චිත්‍රයක්. “ මර්වින් සිල්වා ඇමතිතුමා වගේ බය නැතුව යන්න සර් ” කියලා. අන්න ඒ ලණුව කෑවා. අන්න එහෙමයි ඔක්ස්ෆර්ඩ් ගමන ඔක්ස්ෆර්ඩ් සර්කස් එක වුණේ !

ප්‍රභාකරන් මරලා කොටි ත්‍රස්ත යුද්දෙ ඉවරවුණා විතරයි. අපි කවුරුත් දන්නවා දෙමළ ඩයස්පෝරාව තවම මාලු කන තරහෙන් ඉන්නෙ. මේ තුවාල වේලෙන්න කල් යාවි. මේ වැඩෙන් වුණේ ආයිත් ඒ තුවාලේ නොසෑහෙන්න පෑරුණා. ගොන්කම තමයි!

♦ වෙලේගෙදර රාළ London